# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2339/41 – 2023 ජූලි මස 08 වැනි සෙනසුරාදා – 2023.07.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: : IR / COM / 02/ 2020 / 94.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා වතු සේවක සංගමය (එච්.ජී.කේ.එම්.එස්. කුලතුංග මයා), අංක 6/A, බැංකුව පාර, බදුල්ල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. මල්වත්ත වැලි ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී, අංක 280, වේල්ල වීදිය, කොළඹ 12.
2. අයිස්ලැබි වත්ත, බණ්ඩාරවෙල

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත , රිවඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 4හි නීතිඥ පියල් දර්ශන ගුරුගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජුනි මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 07-0054

1A – G 039845 – 09 (2023/07)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මගේ අංකය: : IR / COM / 02 / 2020 / 94.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ලංකා වතු සේවා සංගමය (එච්.ජී.කේ.එම්.එස්. කුලතුංග මයා), අංක 6A, බැංකුව පාර, බදුල්ල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

1. මල්වත්ත වැලි ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී, අංක 280, වේල්ල වීදිය, කොළඹ 12.
2. අයිස්ලැබි වත්ත, බණ්ඩාරවෙල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ–**

'' එච්.ජී.කේ.එම්.එස්. කුලතුංග මහතාට 2023 ජනවාරි - 2015 සැප්තැම්බර් දක්වා කාලයට අදාළ ගෙවල් කුලී දීමනාව හිමි ද, හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ .''

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජුනි මස 20 වැනි දින,
කොළඹ,
කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07-0054